

# ඔබගේ අනන්‍යතාව අනතුරේ ....


**පරෙස්සම් වන්න. මේ වන විටත් ඔබට නොදැනී ඔබගේ අනන්‍යතාව වෙනත් කෙනෙකු සොරාගෙන ඇතිවා විය හැකිය. ඔබගේ ක්‍රෙඩිට් කාඩ්පත් අංකය, බැංකු ගිණුම් අංකය හෝ ඔබ ගේ අතිශය පුද්ගලික තොරතුරු හරහා තවෙකකු ඔබගේ භාණ්ඩාගාරය හිස්කිරීමට ඉඩකඩ සලස්වාගෙන තිබෙනවා වන්නට පුළුවන. එය එසේනම්, ඔහුගේ හෝ ඇයගේ එම අනවසර සාප්පු සවාරියේ තරම, ඔබගේ මීළඟ ක්‍රෙඩිට් කාඩ් හෝ බැංකු ගිණුම් මාසික ප්‍රකාශනයෙන් ඔබට දැකගත හැකිවනු ඇත. එහෙත් ඒ වන විට කෝච්චිය ගොස් හමාරය. එදිනට ඔබ නඟන හඬ, අවිච්චියාගේ අවනඩුව මෙන් වන්නට ඉඩ ඇත.**

ඇමෙරිකාවේ ඩෙබොරා ප්ලාට් මෙම අකරතැබ්බයට මෑතකදී ගොදුරු වූවාය. වෙළෙඳ ආයතනයක පරිගණකයක තැන්පත් කර තිබූ පාරිභෝගික 'දත්ත සමුදය' (Database) තුළින් මැයගේ විස්තර සොරුන් අතට පත්වී ඇත. මෙම 'දත්ත සොරුන්' (hackers) ඩෙබොරා ගේ මෙන්ම තවත් බොහෝ පාරිභෝගිකයන්ගේ ක්‍රෙඩිට් කාඩ් අංක මෙසේ සොරකම් කර ඇත. ඔවුන් ඉන්පසු ජයටම සාප්පු සවාරියේ යෙදී මෙම ක්‍රෙඩිට් කාඩ්පත්වල ශේෂය ශූන්‍ය කොට ඇත.

"මේ තත්ත්වය නිසා ඇතිවන අවිනිශ්චිත බව හරිම භයානකයි. දැන් මට හිතෙනවා කොයි වෙලාවෙ ආයෙත් මෙහෙම වෙයිද කියලා."

ඩෙබොරා එසේ පවසයි. ඇය ඇමෙරිකා ඒකාබද්ධ වෙළෙඳ කොමිසමේ (Federal Trade Commission) අධ්‍යක්ෂිකාවයි.

වෙළෙඳසැල්වල දත්ත සමුදායන් මෙන්ම බැංකුවල පරිගණක තුළ තැන්පත්කොට ඇති ගනුදෙනුකරුවන්ගේ දත්තයන් ද ආක්‍රමණය කිරීමට මෙම 'දත්ත සොරුන්' සමත්වී ඇත. මෙම දත්ත සොරාගෙන තවත් පාර්ශ්වයන්ට විකිණීමේ ජාවාරමක් ද ඇත.



මොවුන් ගේ අමානුෂික ක්‍රියාවෙන් බැට කන්නේ අසරණ වන්නේ ක්‍රෙඩිට් කාඩ්පත් හිමියා ය. නැතිනම් බැංකු ගිණුම සැබැවටම හිමි පුද්ගලයා ය. මේ ආකාරයට කාරණා කටයුතු සිදුවී ක්‍රෙඩිට් කාඩ්පත හෝ බැංකු ගිණුම හිමි පුද්ගලයා 'කළු ලයිස්තු ගත වූ විට' (Black List) එය ඔහුගේ පෞද්ගලික දිවියට ද බලපායි. අඩුතරමින් ඉන්පසු ඔහුට හෝ ඇයට බැංකු ණයක්වත් ලබාගැනීම පහසු වන්නේ නැත. මෑතක දී ඇමරිකාවේ ස්ථානගතකර තිබූ 'සර්වර් යන්ත්‍රයකින්' (Server) ඔන්ලයින් ගිණුම් විශාල ප්‍රමාණයක 'පාස්වර්ඩ්' (Pass Words) සොරාගෙන ඇත. මේ බව අනාවරණය කළේ 'සන්බෙල්ට් සොෆ්ට්වෙයාර්' නම් ඔන්ලයින් ආරක්ෂක ආයතනයකි. මේ සොරකම සිදුකොට ඇත්තේ 'වයිරසරයක්'(Trojan Virus) උපයෝගී කොට ගනිමිනි.

"පසුගිය මාස නමය ඇතුළත මේ සොරුන් තොරතුරු තාක්ෂණයේ බලය හා නව සොයාගැනීම් පිළිබඳ හොඳින් දැනුවත් වී තිබෙනවා." එසේ පවසන්නේ 'ප්‍රයිවසි ටුඩේ' නම් තවත් ඔන්ලයින් ආරක්ෂක ආයතනයක සේවය කරන රොබ් ඩග්ලස් නැමැත්තා ය.

ඇමරිකාව තුළ පමණක් මෙම දත්ත සොරුන් විසින් අතවසරයෙන් වියදම් කරන මුදල් ප්‍රමාණය වසරකට ඩොලර් බිලියන 53 කි. මින් ඩොලර් බිලියන 5 ක් කෙළින්ම ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන්ගෙන් හෝ බැංකු ගිණුම් හිමියන්ගෙන් සොරා ගැනේ. ඉතිරිය බෙදී යන්නේ සිල්ලර වෙළඳුන් හා වෙළෙඳ ආයතන අතර ය. මුල් වකවානුවේ දී මේ සොරුන් කළේ පික්පොකට් ගැසීමෙන්, ලියුම් පෙට්ටි හාරා ඇවිස්සීමෙන් නැතිනම් ඉවතලන බැංකු හෝ ක්‍රෙඩිට්කාඩ් ප්‍රකාශනවලින් ඔවුනට අවශ්‍ය ගිණුම් අංක හෝ ක්‍රෙඩිට් කාඩ්පත් සොරා ගැනීම ය. එහෙත් දැන් ඔවුන් බොහෝ දියුණු ය. ඔබට හිටි අඩියේම ඊ මේල් මඟින් හෝ තැපෑලෙන් ලියමනක් ලැබීමට පුළුවන. එය පෞද්ගලික ආයතනයකින් හෝ ඔබගේ ම වීසා, මාස්ටර් හෝ ඇමෙක්ස් කාඩ් මධ්‍යස්ථානයෙන් මෙන් බැලූ බැල්මට පෙනෙන්නට පුළුවන. ඔවුන ගේ 'දත්ත සමුදය' (Dara Base) නවීකරණය කිරීම සඳහා (Update) ඔබගේ ගිණුම් විස්තර හා ක්‍රෙඩිට් කාඩ්පතේ විස්තර වහා ලබාදෙන මෙන් ඒ මඟින් ඉල්ලා සිටින්නට පුළුවන. ඔබහට එම කාරිය වඩාත් පහසු කිරීම සඳහා ඔවුන් විසින් ඊමේල් අංකයක් ද ලබාදෙනු ඇත. ඔබ මෙම උගුලට හසුවුණහොත් ඔබ විසින් කරනු ලබන්නේ සොරා ගේ අතටම ඔබගේ රහස්‍ය විස්තර ලබාදීම ය. මේ නිසා නොදන්නා ආයතනවලට තමන් ගේ පෞද්ගලික තොරතුරු ලබාදීමෙන් වැළකී සිටින්න. එමෙන් ම ඔබගේ ක්‍රෙඩිට් කාඩ් මාසික ප්‍රකාශනය හොඳින් කියවන්න. ගෙවීම් පිළිබඳ සැලකිලිමත් වන්න. අවදියෙන් සිටින්න. ගිණුම් ප්‍රකාශන හා ක්‍රෙඩිට් කාඩ් ප්‍රකාශන ගුලිකොට ඉවත නොදමා සැමවිටම ඉරා දමන්න. නැතිනම් ෂ්‍රෙඩ් (Shred) කරන්න.

මෙම ක්‍රමවේදය තනි පුද්ගලයන් ගේ අනන්‍යතාව රැකගැනීමට රුකුලක් වුවද ආයතනික මට්ටමෙන් මෙය ක්‍රියාවේ යෙදවීම අපහසු ය. ආයතන තුළ සිටින පුද්ගලයන් පරිගණක තුළ ඇති දත්තයන් පිටස්තරයන්ට විකුණා දැමූ අවස්ථා වාර්තා වී ඇත. මෙවැනි ක්‍රියාවන්ට බොහෝවිට යොමුවී ඇත්තේ 'අනියම් පදනම මත' බඳවාගන්නා ලද (Outsourced) සේවකයන් ය. මේ නිසා දැනටමත් ඉන්දියාව තුළ අනියම් සේවකයන් බඳවාගැනීමට විරුද්ධව උද්ඝෝෂණ ඇරැඹී ඇත.

## අනන්‍යතා සොරුන්ට අවශ්‍ය ඔබගේ තොරතුරු

ක්‍රෙඩිට් කාඩ් අංකයන් ක්‍රෙඩිට් කාඩ්පත පිටුපස ඇති ආරක්ෂිත අංකයන් (Security numbers on the back of the card)

රක්ෂණ අංකය
රියැදුරු බලපත් අංකය
ATM අංකය
උපන් දිනය
පාස්වර්ඩ් / පින් (PIN)
නිවසේ ලිපිනය
දුරකථන අංක



# ඔබ ආරක්ෂා විය යුත්තේ කෙලෙස ද?

**ක්‍රෙඩිට් කාඩ්පත් / බැංකු ගිණුම්**

ක්‍රෙඩිට් කාඩ්පතට අදාළ සියලු තොරතුරු හා බැංකු ගිණුම්වල තොරතුරු ජායා පිටපත්කොට තබාගන්න.

ක්‍රෙඩිට් කාඩ්පතට අදාළව ඔබ සිදු කළ ගෙවීම්වල කුවිතාන්සි ළඟ තබා ගන්න

අලුත් ක්‍රෙඩිට්කාඩ්පත නියමිත වේලාවට ඔබ වෙත නොලැබුණහොත් වහාම තිකුත් කරන්නා අමතන්න

**පාස් වර්ඩ් / PIN අංක**

මවගේ විවාහයට පෙර නම, උපන් දිනය, ඔබ ගේ මැද නම, සුරතලා ගේ නම හෝ එක දිගට ආරෝහණව හෝ අවරෝහණව කියැවෙන අංක කිහිපයක් කිසිවිට යොදා නොගන්න.

ඔබගේ බැංකු ගිණුම සඳහා දෙවැනි පාස්වර්ඩ් එකක් ද භාවිත කරන්න

PIN අංක හෝ පාස්වර්ඩ් ලියා නොතබා මතකයේ තබාගන්න

ඔබගේ බැංකුවේ නියෝජිතයකු යැයි කියාගන්නා කිසිවකුටත් ඔබගේ PIN අංකය හෝ පාස්වර්ඩ් ලබා නොදෙන්න (වගකිවයුතු බැංකුවක් මේ දෙය කරන්නේ නැත. එහෙත් මෙය අනන්‍යතා සොරුන් ගේ ප්‍රියතම උපක්‍රමයකි.)

**ඉන්ටර්නෙට් / පරිගණක**

වයිරස් වලින් ආරක්ෂා වන මෘදුකාංග (Soft ware) භාවිත කරන්න

ප්‍රධාන ලිපිගොනු (Files) පාස්වර්ඩ් මගින් ආරක්ෂා කරන්න

PC යන්ත්‍රය ඉවත්කරන විට දත්ත මකා ඉවත් කිරීමට (delete) මතක තබාගන්න

සෑම මසකම බිල්පත් හොඳින් පරීක්ෂා කරන්න

# එය ඔබටත් සිදුවූවොත් ඔබ ගත යුතු පියවර

***ඔබගේ ණය අයදුම්පත ප්‍රතික්ෂේප වී ඇත්නම්,***
***ඔබගේ ණය / ක්‍රෙඩිට් කාඩ් ප්‍රකාශනයේ ඔබට නුහුරු දෑ සටහන් වී ඇත්නම්,***
***ඔබ ගෙවීම් හරියාකාරව කර තිබියදීත් ගෙවීම් පැහැර හැර ඇතැයි චෝදනා එල්ලවේනම්,***
***ඔබගේ ණයවලට අදාළ ලියකියවිලි සොරකම් කොට ඇත්නම්***

**පියවර 1**

ඔබගේ අනන්‍යතාව සොරකම් කොට ඇත්නම්, පොලීසියට කතාකොට පැමිණිල්ලක් ගොණු කරන්න. පැමිණිලි අංකය ලබාගන්න අමතක නොකරන්න.

**පියවර 2**

ඔබට ක්‍රෙඩිට් කාඩ්පත හෝ ණය ලබාදුන් ආයතනය / පුද්ගලයා හා වහා සම්බන්ධ වන්න

සාකච්ඡා කොට ඔබ විසින් ආරම්භ කරන ලද සියලුම ගිණුම් වසා දමන්න


අදාළ ක්‍රෙඩිට්පත් හෝ ණය ලබාදුන් ආයතනයට කතාකොට පසුගිය වාර ප්‍රකාශනවල පිටපත් ලබාගෙන ඒවා පරීක්ෂා කරන්න

අදාළ ආයතන / පුද්ලයන් හට ලිපි මගින් කරුණු දක්වන්න. එම ලිපිවල හා ඇමුණුම්වල පිටපත් ළඟ තබාගන්න

ඔබ මෙම ක්‍රියාවලිය සඳහා ගත කළ කාලය හා දින වකවානු මතකයේ තබාගන්න

**පියවර 3**

ඔබගේ සියලු අලුත් ගිණුම් සඳහා අලුත් 'පාස්වර්ඩ්' ලබා දෙන්න



ඇතැම්විට පෞද්ගලික දත්ත රැගත් ලැප්ටොප් යන්ත්‍ර කාර්යාලවලින් අතුරුදන්වූ අවස්ථා ද ඇත.

ඉන්දියාව තුළ ක්‍රියාත්මක වන සිටි බැන්ක් (Citibank) ශාඛාවක් මගින් ගනුදෙනුකරුවන් හා දුරකථනයෙන් කතා කිරීමේ සේවාව (Call center) පිටත ආයතනයකට පවරා (Outsourced) ඇත. පසුව එම ආයතනයේ සේවකයන් කිහිපපොළක් එකතු වී(Citibank) ගනුදෙනුකරුවන්ගෙන් ඩොලර් 350,000 ක් වංචා කොට ඇත.

එමෙන්ම Bank of Amerika නම් වන බැංකුවෙන් පසුගිය දෙසැම්බරයේ දී මිලියන 1.2 ක් වන රජයේ සේවකයන් ගේ තොරතුරු රැගත් 'බැකප් ටේප් (Backup tapes) අතුරුදන් වී ඇත.

කාඩ් මධ්‍යස්ථානයන් හි නොසැලකිලිමත්කම හේතුවෙන් බොහෝ විට මෙම සොරකම් සිදු වේ. 'කාඩ් සිස්ටම්ස්' (Card Systems) නම් ක්‍රෙඩිට් කාඩ් මධ්‍යස්ථානයේ කාඩ්පත් හිමියන් හා වෙළෙඳ මහතුන් අතර වසරක් තුළ ඩොලර් බිලියන 15 ක ක්‍රෙඩිට් කාඩ් ගනුදෙනු සිදුවේ.

කාඩ් සිස්ටම්ස් ආයතනය, ඔවුන් 'මාස්ටර් කාඩ්' හා 'වීසා' යන ආයතන සමඟ ඇතිකරගෙන සිටි එකගතාව උල්ලංඝනය කරමින් ක්‍රෙඩිට් කාඩ් අංක මිලියන 40 ක් පර්යේෂණ කටයුතු සඳහා යැයි පවසමින් ළඟ තබාගෙන ඇත.

ඩිජිටල් ආක්‍රමණිකයන් විසින් මෙම තොරතුරු කාටත් හොරා පරිගණක පද්ධතිය තුළින්ම උරාගෙන ඇත. එහි ප්‍රධාන විධායක නිලධාරී 'ජෝන් පෙරී' පවසන්නේ මේ වන විට ඒ ආකාරයට සොරාගැනීම වළකන උපාංගයක් තම පරිගණක පද්ධතියට සම්බන්ධ කොට ඇති බව ය.

එහෙත් මෙම අකරතැබ්බයට ගොදුරු වූ කාඩ්පත් හිමියන් නගන මැසිවිල්ලට ඔහු වෙත පිළිතුරු නොමැත.

ඔන්ලයින් සොරුන්ගෙන් හා අනන්‍යතා සොරුන්ගෙන් ආරක්ෂාවීම සඳහා අප වඩ වඩාත් දැනුවත් විය යුතු කාලය පැමිණ ඇත.

## ආයතනික මට්ටමින් අනන්‍යතා සොරකම් කිරීම

1. අනන්‍යතා සොරුන් බොහෝවිට ආක්‍රමණය කරන ස්ථානයන් හා පුද්ගලයන්

බැංකු, පාසල්, ආයතනික ප්‍රධානීන්, වෛද්‍යවරුන් ·

රාජ්‍ය ඒජන්සි

දුරකථන ආයතන

වෙළෙඳුන්

ඩෙබිට්, ක්‍රෙඩිට්, ATM කාඩ්පත් ජාලයන්

## අනන්‍යතා සොරකම් කෙරෙන විධික්‍රම

(1) කාර්යාල තුළ, නිවෙස් තුළ, මහාමාර්ගයේ ඇති අනවශ්‍ය ද දමන බාස්කට් හෝ බක්කි අවුස්සා ක්‍රෙඩිට් කාඩ් ලියකියවිලි, බැංකු ණයවලට අදාළ ලියකියවිලි ආදිය සොරාගැනීම

(2) ATM යන්ත්‍ර හා දුරකථන පෙට්ටි (Phone booths) අසළ රැඳෙමින් PIN අංක සොරාගැනීම

(3) ATM යන්ත්‍රයට හෝ වෙළෙඳසල්වල ඇති ටර්මිනල් යන්ත්‍රයට උපාංගයක් සවිකොට, (data storage device) එමගින් දත්ත උරා ගැනීම

(4) ඊ මේල් මගින් හෝ දුරකථනයෙන් කතාකොට ඔබගේ ගිණුමෙහි වරදක් ඇතැයි පවසා ඔබගෙන් ම දත්තයන් ලබාගැනීම

(5) ඉඩම් හිමියකු, ණය ඇස්තමේන්තු කරන නිලධාරියකු හෝ රජයේ නිලධාරියකු ලෙස පෙනී සිට තොරතුරු ලබාගැනීම

(6) ලියුම් පෙට්ටි හැර, ඒ තුළ ඇති ක්‍රෙඩිට් කාඩ් ප්‍රකාශන, බැංකු ගිණුම් ප්‍රකාශන ආදිය සොරාගැනීම

(7) සිල්ලර වෙළෙඳ සල්, ඩිස්පැන්සරි ආදියෙන් ලියකියවිලි සොරාගැනීම. මෙම ක්‍රියාව එම තැන්වල සේවයේ යෙදී සිටින අයවලුන්ට අල්ලස් ලබාදීමෙන් ද සිදු කරයි.

❑

**චන්න බණ්ඩාර විජේකෝන්**